
# වරායේ පිලිසඳරක්

## වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් උදෙසා



(නව තාක්ෂණය, නීති රීති හා සම්ප්‍රදායයන්)

# අන්තර්ගතය

සිතන්නට යමක් ...

වරායේ පිලිසඳරක් (01)- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය

වරායේ පිලිසඳරක් (02)- අළුත් නීති

වරායේ පිලිසඳරක් (03)- තහනම් ආම්පන්න

# සිතන්නට යමක් ...

අනාදිමත් කාලයක සිට අපි විවිධත්වය වැඩි මෙන්ම ගුණාත්මක අගය වැඩි මසුන් සපයන ධීවර කර්මාන්තයක යෙදුනෙමු. අප තුල පවතින ධීවර හැකියාවන් කලාපයේ වෙනත් රටවල දක්නට නොමැත. මරුවැල් පන්නය වැනි ක්‍රමවල අප සතු හැකියාව සමහර දියුණු රටවල්ද ඉක්මවා යයි.

අප සතු පාරම්පරික ධීවර දැනුම නවීන කළමනාරණ ක්‍රමවේදයට එකතු කර ගැනීමේ අරමුණෙන් ලොව පුරා විද්‍යාඥයින් නිරතුරුවම පරීක්ෂණ පවත්වති.


ඒ තත්වයට අප ගෙන ඒමට අපගේ මුතුන්මිත්තන් විශාල පරිශ්‍රමයක් දැරූහ. ආගමෙන් හා සංස්කෘතියෙන් ලද ආභාශයෙන් ඔවුන් හැම විටම යහපත් හා පරිසර හිතකාමී ධීවර ක්‍රම වල යෙදුනහ. අනාගත පරපුරට එනම් වර්තමානයේ අපට ධීවර සම්පත් ඉතුරු කර දීමට ඔවුන් සැම විටම කටයුතු කලහ.

ඔවුන් භාවිතා කලේ එකල තිබූ හොඳම තාක්ෂණයයි. එහෙත් තාක්ෂණයට වහකීම ඉක්මවායාමට ඔවුන් ඉඩ නොතැබූහ. ප්‍රතිපලය ලෝක පූජිත ධීවර කර්මන්තයක හිමිකරුවන් ලෙස අප පිලිගැනීමට ලක්වීමයි. අපේ මසුන්ට ලෝකයේ ඉහල ඉල්ලුමක් හිමිවීමයි.

**එහෙත්** . . . .

**අද....**

අපට පාලනය කල නොහැකි විවිධ හේතුන් නිසා අද ලොව මසුන් සම්පත වඳවී යමින් පවතී. මෙය ලංකා ජලතීරයට පමණක් සීමා වුවක් නොව මුලු ලොව පුරාම දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. **වගකීමකින් තොරව අප සිදු කරන ධීවර කටයුතු දිගටම සිදුවුවහොත් 2048 දී සියලුම ධීවර කර්මාන්තයන් අභාවයට යනු ඇත**




නිසිසේ කලමණාකරණය කරන ලද ධීවර කර්මන්තයක් දේශීය වශයෙන් පමණක් නොව අන්තර්ජාතික මට්ටමෙන්ද ඇතිකල යුතු බව අන්තර්ජාතික ප්‍රජාව පිලිගත් අතර ඒ සඳහා ජගත් සාගර නීතිය යටතේ සම්මත ගණනාවකට එලැඹී ඇත. මෙම සම්මතයන් නිසා වගකීමකින් මසුන් මැරීම යන විධි ක්‍රමය වෙනස් වී ඇත.

1) තහනම් ආම්පන්න භාවිතා නොකිරීමට අමතරවල
2) ජාත්‍යන්තරය එකගවූ නීති රාමුවක ක්‍රියා කිරීම හා
3) අල්ලාගන්නා මසුන් ප්‍රමාණ නිවැරදිව වාර්තා කිරීමත්

මෙම වගකීමට යටත්ය.

එබැවින් අප හැම නැවතත් අපගේ මුතුන්මිත්තන් ලෙස වගකීමෙන් ක්‍රියාකල යුතු කාලය එලැඹ ඇත. ලෝකයේම ධීවර කර්මාන්තය වගකීමකින් යුතුව කිරීමට සියල්ලොම ගිවිසගෙන ඇත. **එක අතකට වගකීමකින් යුතුව ධීවර**

**කර්මාන්තයේ යෙදීම පිලිබඳව විදේශිකයන් කියා දෙන තුරු ප්‍රමාදවීමට සිදුවීම අප වැනි දියුණු සංස්කෘතියක් හිමි රටකට නොතරම් කරුණකි.**

ජාත්‍යන්තර නීතී සකස්වී ඇත්තේද මසුන් සම්පත රැක ගැනීමේ උවමනාවෙනි. රටක් ලෙස අපද ඒවාට එකගවී ඇත්තෙමු. ඒ නීතී රාමුවට පිටින් යාමේ ප්‍රතිවිපාක නිසා පෞද්ගලිකව අපට වඩා රටට සිදුවන පාඩුව අවමානය අති මහත්ය. වර්තමානයේ අප ඒ අත්දැකීමට මුහුණ දී ඇත්තෙමු.

යුරෝපා සංගමය විසින් අපගේ මත්ස්‍ය අපනයනයට බාධක පැණවීම, මසුන් අපනයනයේ යෙදෙන සමාගම් කිහිපයකට හෝ එම සමාගම් වලට මසුන් සපයන ධීවරයන්ට හෝ පමණක් සිදුවූ පාඩුවක් නොව පොදුවේ ලංකාවේ අප සැමටම සිදුවූ බාධකයකි.

යුරෝපා තහනමට ප්‍රධාන හේතු වී ඇත්තේ අප අල්ලන මසුන් ගැන නිසිලෙස වාර්තා නොකිරීමත්, අන්තර් ජාතික මුහුදු නීති වලට ගරු නොකිරීමත්ය. මේ තත්ත්වය පාලනයට ලංකා රජය පියවර රාශියක් ගෙන ඇත.

**අල්ලන මසුන් ගැන වාර්තා කිරීම වැදගත් වන්නේ කෙසේද?**

ලොව සියලුම ධීවරයින් තමන් අල්ලන මසුන් ප්‍රමාණ ඒවා අල්ලන ස්ථානත් සමගම වාර්තා කලහොත් ලොව පුරා මසුන් මුහුදෙන් ඉවත් කරන ප්‍රමාණ ගැන දැනුවත් වීමට අවස්ථාව ලැබේ. මුලු ලෝකයටම අවුරුද්දකට අල්ලන මසුන් ගැන දැනගැනීම මගින් මුහුදේ මසුන් ප්‍රමාණ ඉදිරියටත් පවත්වා ගැනීමටත් ධීවරයා රැක ගැනීමට අවශ්‍යය තීරණ ගැනීමටත් පහසු වේ.

හැබැයි එක් ධීවරයෙකු හෝ එම විස්තර වැරදියට ලබා දුනහොත් මෙම මුලු දත්තයන්ටම මෙය බලපානු ලබයි. මෙය එකා සැමටත් සැම එකාටත් යන සමුපකාර ක්‍රමයේ නවීන යෙදවුමක් ලෙස දැක්විය හැක.

අනෙත් වැදගත් කරුණ වන්නේ විශේෂයෙන්ම අන්තර්ජාතික මුහුදේ ධීවර කර්මන්තයට යාත්‍රා යවන්නේනම් ඒවා විසින් සිදුකරණ ක්‍රියාවන් පිලිබඳව

දැන ගැනීමේ හා ඒවා පාලනය කිරීමේ යන්ත්‍රණයක් රටක් ලෙස අප සතුවිය යුතුවිමයි. හරියට ගොඩබිම්දී වාහන පාලනය කිරීමට පොලීසියක් හා අහස් යාත්‍රා පාලනයට ක්‍රමවේදයක් අවශ්‍යවන්නා සේය. ගුවනේ පාලනයක් නැත්නම් එකදු අහස් යානයක් හෝ ඉහල නැංවීමට අපට නොහැකි වනු ඇත.

**මෙවැනි කරුණු ඉටු වන්නේනම් ලෝකයේ මත්ස්‍ය සම්පත් හිගවීම හමුවේ වුවද අපට මේ කර්මාන්තය දියුණු කිරීමේ ඉඩ ප්‍රස්ථා ඇත. ඒ අප වගකීමෙන් යුතුව ධීවර කර්මන්තයේ යෙදුනහොත් පමණි.**

## වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයේ යෙදීමේ වර්තමාන ක්‍රමවේදය කුමක්ද ?

තහනම් නොවන අම්පන්න භාවිතා කිරීමට අමතරව, ජාත්‍යන්තරය එකගවූ නීති රාමුවක ක්‍රියා කිරීම හා අල්ලාගන්නා මසුන් ප්‍රමාණ නිවැරදිව වාර්තා කිරීමත් මෙම වගකීමට යටත්ය.

## අල්ලාගන්නා මසුන් ප්‍රමාණ නිවැරදිව වාර්තා කිරීමේ ක්‍රම මොනවාද ?

- ලොග් සටහන් පොත් ඉතා නිවැරදිව පවත්වාගෙන යාම හා ධීවර ගමන් වාරයක් අවසානයේදී හැකි ඉක්මනින් පිටපත් ධීවර දෙපර්තමේන්තුවට භාර දීම
- ඔබ යාත්‍රාව ගැන තොරතුරු පිටත්වීමට පෙර හා පැමිනීමෙන් පසු හැකි ඉක්මනින් වරාය අධිකාරියට දැනුම් දීම
- ඔබ යාත්‍රාවේ තොරතුරු ස්වංක්‍රීයව දැනුම් දෙන යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය යාත්‍රාවේ සුරක්ෂිතව සවි කර තැබීම
- ධීවර නිලධාරින් හට තම යාත්‍රාව පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාදීම.
- ඔබ යත්‍රාව විශාල එකක් නම් අදාල තොරතුරු විද්‍යාත්මකව සැපයිය යුතු නිසා වරින් වර ඔබ යාත්‍රාවේ ගමන් කිරීමට යාත්‍රා නිරීක්ෂකයින්ට ඉඩ ලබාදීම.

ඔවුන් එම කාර්යන් කරන්නේ රට වෙනුවෙන් හා මුළු ලෝකයේම ධීවර සම්පත වෙනුවෙනි. එබැවින් මෙම පරීක්ෂා කිරීම්වලට ඉඩ ලබාදීම ඔබ සතු පරම යුතුකමකි.

**ඉහත දේවල් සිදුකලානම් ඔබ තොරතුරු ලබාදීමේ වගකීම ඉටුකල ධීවර කාර්මිකයෙකු වනු ඇත.**

## නීති රාමුවක් අවශ්‍යවන්නේ ඇයි ?

ධීවර නීති පණවා ඇත්තේ ඔබට දඩුවම් කිරීමේ පරම අදිටනින් යුතුව නොවන අතර සියලුම ධීවර කටයුතු එකම ක්‍රම වේදයක් ඔස්සේ පවත්වාගෙන යාමේ වැදගත්කම නිසාය.

බොහෝ ධීවර නීති ගැන ඔබ දැනුවත් නමුත් අන්තර් ජාතික මුහුදේ ධීවර කටයුතු කරන්නේනම් ඔබ විසින් අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු නිතී කිහිපයක් මෑතකදී පණවා ඇත. ඒවා පහත පරිදි වේ.

- යාත්‍රා නිරීක්ෂණ පද්ධති ට්‍රාන්ස්පොන්ඩරයක් අනිවාර්‍යයෙන්ම සවිකර තිබීම
- ඔබ යාත්‍රාවට අදාලව අන්තර්ජාතික මුහුදේ රැකියාව සඳහා වන මෙහෙයුම් බලපත්‍රයක් ලබගැනීම හා ඔබ යාත්‍රාවේ ලියාපදිංචි සහතිකය සමග එම බලපත්‍රය යාත්‍රාව තුලම තබා ගැනීම
- ලොග්පොත යාත්‍රාව තුලම තබා ගැනීම හා එය නිරතුවම යාවත්කාලින කිරීම හා රැකියාව අවසානයේ ලොග්පිටපත් ධීවර පරීක්ෂකතුමාට භාර දීම
- ඔබගේ අම්පන්න බලපත්‍ර අංක යොදා සලකුණු කර තිබීම
- ඔබ නියමුවාට ධීවර දෙපර්තමෙන්තුවේ බලපත්‍රයක් තිබීම
- ඔබ යත්‍රාවට විදුලි නියාමන සංදේශ කොමිසම විසින් නිකුත් කරන ලද ඇමතුම් කේතයක් ලබාගෙන තිබිය යුතුය
- ලංකාවේ කොඩිය හා ශ්‍රී ලාංකික නාමය, යාත්‍රාවේ ලියාපදිංචි අංකය, ඇමතුම් කේතය යාත්‍රාවේ පැහැදිලිව සටහන් කර තිබිය යුතුය.
- කැස්බෑවන්, ඩොල්පින් අතුලු මුහුදු ක්ෂීරපායීන්, මුහුදු කුරුල්ලන්, කසමෝරුන් ඇතුලු වෙනත් තහනම් මසුන් දැලට හසු වුවහොත් වහාම නැවත මුදාහැරිය යුතුය.

- මෝරුන් ඇල්ලිමට හැඹිලිදැල් එලීම නොකල යුතුය. වෙනත් ධීවර කටයුතු සඳහා හැලි දැල් එලන්නෙනම් අදාල දිග, උස හා ඇස් ප්‍රමාණ වලට සීමා විය යුතුය.

**ඉහත දේවල් සිදුකලානම් ඔබ ජාත්‍යන්තරව එකගවූ නීතිරාමුවක ක්‍රියාකල රට අපකීර්තිමත් කිරීමට වැඩ නොකල ධීවර කාර්මිකයෙකු වන්නේය.**

තහනම් යැයි ප්‍රකාශිත කිසිම ආම්පන්නයක් ඔබ යාත්‍රාවේ රැගෙන නොයා යුතුය. තහනම් ආම්පන්නයක් නොවුවද කි.මී.2.5ට වැඩි කරමල් දැල් රැගෙන යාමට ඔබට අවකාශ නැත. එසේ නීතියක් පනවා ඇත්තේ කරමල් දැල්වලින් අල්ලන මසුන්ගේ අගය අඩු නිසා මත්ස්‍ය සම්පතින් උපරිම ප්‍රයොජනයක් ගැනිමේ අවස්ථාව නැතිවන හේතුව නිසාවෙනි. දියුණු ධීවර ප්‍රජාවන් කරම දැල් භාවිතයෙන් වැලකී ඇත. එහෙත් අප චිරාත් කාලයක් තිස්සෙ මෙම ක්‍රමය පවත්වාගෙන ආ නිසා මෙම අවස්ථාව අපහට සීමා සහිතව ලබා දී ඇත.

මසුන් මැරීම තහනම් කල ප්‍රදේශ හෝ වෙනත් රටවල මුහුදු සීමාවලට අවසරයකින් තොරව ඇතුල් නොවිය යුතුවේ.

කරුණු වශයෙන් ගත් කල ඉටු කල යුතු ක්‍රියා රාශියක් තිබුනද මේ සියල්ලම එකම ආකල්පයක් ඔස්සේ ක්‍රියා කිරීමෙන් ලගා කර ගත හැක. එනම් වගකීමෙන් යුතුව, මසුන් සම්පතේ හා වෙනත් පාර්ශව වල අයිතිවාසිකම් සුරැකෙන සේ වැඩ කිරීමෙනි. එය ගොඩබිමදී අපි දන්ඩනීති සංග්‍රහය කටපාඩම් නොකරන නමුත් නීතිගරුකව හිතට එකගව ජීවත් වන්නා හා සමාන ක්‍රියාවලියකි.

එසේ වුවතොත් ඔබ ඔබේ අනාගත පරපුර වෙනුවෙන්, රටවෙනුවෙන් හා අවසානයේ ලෝකයේම මත්ස්‍ය සම්පත් වෙනුවෙන් ඔබේ ධීවර වගකීම ඉටුකල අයෙකු ලෙස අපේ මුතුන්මිත්තන් හා සමතැන් ගනු ඇත. **එමෙන්ම වර්ශ 2048 දී අනාගත පරපුරේ සුසුම් වලට ඔබ වග නොකියන්නෙකු වනු ඇත.**

# වරායේ පිලිසඳරක් (01)- **යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය**



ඈත අහසේ වාඩමක් එන බවට ඉගි පල කරද්දී උදෑසන මාළු බෑමෙන් පසු වරායෙන් එලියට එන ජුඩ් කල්පනා කලේ ටැංකි බෝට්ටුවට පොඩි පොඩි අළුත්වැඩියා කිහිපයක්ම කල යුතු නිසා මුදලාලිට කියා ඉක්මනින්ම එවා කරගතයුතු බවය. කොහේද මුදලාලි කියන්නේ මෙවර ට්‍රාන්ස්පොන්ඩරය හයි කරන්න කියා ධීවර මහත්තයා කිවු නිසා වියදම් වැඩි බවයි.

**ආ....ධීවර මහත්තයත් ඇවිත් ඉන්නෙ**

**ධීවර පරීක්ෂක:** කොහොමද ජුඩ් ලබන අවුරුද්දට හයි-සී ලයිසන් ගන්න ලෑස්ති නෑ නේද තාම

**ධීවර කාර්මිකයා:** අනේ මන්ද මහත්තයලත් එක-එක ඒවා බෝට්ටුවේ හයි කරන්න කියනවා, එතකන් ලයිසන් දෙන්නේ නෑනේ ඉතින්

**ධීවර පරීක්ෂක:** යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය ගැනනේ ඔය කියන්නේ ට්‍රාන්ස්පොන්ඩරය නැතුව මුහුදට යන්න බෑනේ ජුඩි. වී.එම්.එස් (VMS) කියල කෙටියෙන් කියන්නෙත් ඕකටමනේ.

**ධීවර කාර්මිකයා:** මහතැන්ලත් ඉතින් සුද්දෝ කියන ඒව අහගෙන ඉඳල අපිටත් ඒවා කරන්න කියනවා. ඔකෙන් අපට ඇති වැඩේ මොකක්ද ?

**ධීවර පරීක්ෂක:** එතන තමයි අපට වැරදුනේ ජුඩි, වගකීමෙන් යුතුව ධීවර කර්මාන්තයේ යෙදෙන හැටි සුද්දන් කියනකම් පමා උන එක අපි වගේ දියුණු සංස්කෘතියක් තියන රටකට හරි මදිනේ

**ධීවර කාර්මිකයා:** මොකක්ද ? ඒ කතාවේ තේරුම

**ධීවර පරීක්ෂක:** දැන් මෙහෙමනේ අපි රස්සා කරන්නේ මුහුදු යන්නේ තනි තනිවම උනාට රටක් හැටියට ජාත්‍යන්තර මුහුදේ පන්න කරනවනානම් ඒ රටට පුලුවන් වෙන්න ඕනේ තමන්ගෙ සීමාවෙන් එලියට යන බෝට්ටු පාලනය කරගන්න. නැතිනම් ඒක වගකීම පැහැර හැරීමක්නේ.

උදාහරණයක් විදියට ලංකාවට අහස්-යාත්‍රා පාලනය කරන හැකියාවක් නැත්තම් ගුවන් සේවා දාන්න දෙන්නෙ නැහැනේ. ඉතින් අපට ඒ වගකීම තියනවා.

**ධීවර කාර්මිකයා:** ඒ උනාට මහත්තයො අපි කරන ධීවර රස්සාව අහස් යාත්‍රා වගේ ලොකු රස්සාවක් නෙවෙයිනේ.

**ධීවර පරීක්ෂක:** එහෙම හිතන එක තමයි ප්‍රශ්නෙ හිතේ හයියට ගියාට මොකද අපි යන්නෙ මුළු ලෝකයටම අයිති ප්‍රදේශයකට එහෙ නීතිය වෙනස්. ඒ නීතිය කැඩුවොත් ගොඩබිමදි වගේ නෙවෙයි දඩුවම් විදින්න වෙන්නේ රටටමයි. සුද්දො කියන්නෙ ඔන තරම් ඈතට ගියාට කමක් නැලු. හැබැයි ඔයගොල්ලො යන්නෙ කොහේද කරන්නෙ මොනවද කියල ගොඩ බිම ඉඳන් බලන්න පුලුවන් ක්‍රමයක් තියෙනවනම්. ඒ ක්‍රමය තමයි යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය

**ධීවර කාර්මිකයා:** ඉතින් රටටම බලපානවනම් අපිට ඒක හයි කරල දෙන්නකො නොමිලේම

**ධීවර පරීක්ෂක:** එහෙම කියන්න එපා. මේව කරන්නෙ ඔය ගොල්ලගේම හොඳට. අනික ඕකට සහනාධාරයක් දෙනවනේ. ඉතිරිය බැංකු ණයකින් ගන්නත් පුලුවන්නේ. මේ පද්ධතිය දාන්නම ආණ්ඩුවෙන් කෝටි ගාණක් වියදම් කලා ඒ ඔක්කොම ධීවර කර්මාන්තේ රැකගන්නයි. ඔයගොල්ලො වෙනුවෙනුයි. දැන් ඔයගොල්ලන්ගෙ වාරේ එකට සපෝර්ට් කරන්න.

**ධීවර කාර්මිකයා:** කෝටි ගාණක් වියදම් කලේ මොකටද ?

**ධීවර පරීක්ෂක:** ඇයි මේ පද්ධතිය පාලනය වෙන්නේ චන්ද්‍රිකා වලින්නෙ ඒව සම්බන්ද කරගන්න මූලික ගෙවීම්, එතකොට මේකට කොම්පියුටර් පද්ධතියක් ඕනේ, එකේ තියන ලොකු ඩිජිටල් තිර වලින් ලෝක සිතියමක හැම බෝට්ටුවක්ම තියන තැන පෙන්නනවා.

**ධීවර කාර්මිකයා:** අම්මප, එතකොට හදිස්සියකදි අපි ඉන්න තැන දැනගන්න පුලුවන්වෙනවද ?

**ධීවර පරීක්ෂක:** ඔවු මේකෙ තියන ලොකුම වාසිය එකයි

**ධීවර කාර්මිකයා:** ඒ වුනාට ඕක ගලවල දැම්මම ඉවරයිනේ එතකොට මායිම් පැනල ඇවිත් අයේ හයි කරනවා.

**ධීවර පරීක්ෂක:** ඒ වැඩේ කරන්න බෑ ට්‍රාන්ස්පොන්ඩරේ ගැලෙවොත් එවෙලේම රතුපාටින් ඒ බොට්ටුව තිරේ පෙන්නනවා. අනික එහෙම කරන එක නීතියෙන් වරදක් වෙනවා.

**ධීවර කාර්මිකයා:** එහෙම නීතියක් අපි අහල නෑනේ

**ධීවර පරීක්ෂක:** එහෙම නීතියක් අලුතෙන්ම දැම්මා එකට කියන්නෙ VMS රෙගුලාසි එකේ ඔය ගැන විතරක් නෙවෙයි VMS ක්‍රියාත්මක වෙන හැටි ගැන ගොඩක් දේවල් තියනවා. ඉඩ තියන වෙලාවක කියවලා බලන්නකෝ.

**ධීවර කාර්මිකයා:** අපොයි මහත්තයෝ නීතී වල තියෙන බාසාව තේරුම් ගන්න හරි අමාරුයිනේ

**ධීවර පරීක්ෂක:** ඉතින් ඕනේ වෙලාවක අපෙන් අහන්න එකටනේ අපි ඉන්නේ

**ධීවර කාර්මිකයා:** තව දෙයක් මහත්තයෝ, දැන් මාළු වැඩිපුර අහුවෙන තැන් ගැන විස්තර අපි රහසිගත්ව තමයි තියාගන්නෙ. කොටින්ම එවා රේඩියෝ එකෙන් කියන්නෙත් කෝඩ් පාවිච්චි කරල. ඉතින් මේ පද්ධතියන් ඒ තොරතුරු එලියට යාවිද ?

**ධීවර පරීක්ෂක:** අපෝ නෑ මේ තොරතුරු ඔක්කොම රහසිගතයි. කොටින්ම VMS පද්ධතිය වැඩ කරන නිලධාරීන්ටත් නීති රීති තියනවා. ඒ තොරතුරු පිටත්ට කොහෙත්ම දෙන්නේ නෑ.

**ධීවර කාර්මිකයා:** හම්.......මෙච්චර කල් ඕනේ වෙච්චි නැති යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය දැන් ඕනේ උනේ කොහොමද ?

**ධීවර පරීක්ෂක:** මුහුදේ මාළු හිඟ වෙන එක වලක්වන්න ඔනේ නිසා මාළු කොච්චර අල්ලනවද කියල දැනගන්නත් එක්කයි මේ අළුත් දේවල් ගෙන්නේ, මේ වගෙ දත්ත එකතු කරගෙන අපේ දෙපාර්තමේන්තුව පිටරට එක්ක හුවමාරු කරගන්න ඕනෙ ට්‍රාන්ස්පොන්ඩරය හයි කරල ඔයගෝලො රස්සාවෙ යනකොට ඒ ගැන කරන්න වැඩ ගොඩක් දෙපාර්තමේන්තුවට තියනව අනික අන්තර්ජාතික මුහුදෙදි වැටලීම් කරන විවිධ කට්ටිය දැන් ඉන්නවා ඒ අයට වී.එම්.එස් නැතිව අහු උනොත් එවෙලේම නීති ක්‍රියත්මක කරනවා. අපිට ඔයගොල්ලට දඩ ගහන්න වෙනව.

**ධීවර කාර්මිකයා:** ඉතින් මේ පාර දඬේ ගෙවල අයෙත් යනවනේ

**ධීවර පරීක්ෂක:** දැන් දඩය ගොඩක් වැඩී. අනෙක එකපාරකට වඩා අහු උනොත් ඔයගොල්ලොව ජාත්‍යාන්තර බෝට්ටු ලැස්තුවෙන් අයින් කරනවා, බෝට්ටුවලයි නියමුවන්ගෙයි විස්තර ප්‍රසිද්ද කරනවා.

**ධීවර කාර්මිකයා:** හැබැට මම අහන්නමයි හිටියේ ඔය ජාත්‍යාන්තර බෝට්ටු ලැස්තුව තියෙන්නෙ කොහේද ?

**ධීවර පරීක්ෂක:** ඒක අපේ ප්‍රධාන කාර්යාලෙ තියනවා අයි.ඕ.ටී.සී. කියන සංවිධානේන් ඉන්ටර්නෙට් එකේ දානව ඕනේ කෙනෙක්ට බලා ගන්න පුලුවන්

**ධීවර කාර්මිකයා:** අපේ කොල්ලටත් කියන්න ඔනේ අපේ බෝට්ටුවත් තියනවද කියල බලන්න ඔනේ කියල

**ධීවර පරීක්ෂක:** ඔවු පුතාවත් මේ වැඩ වලට හවුල් කරගන්න ඒයාලට මේකෙ බැරෑරුම් කම තේරුම් ගන්න ලේසී

**ධීවර කාර්මිකයා:** පුතා කියන්නේ වී.එම්.එස්. එකෙන් අපිට වැඩක් නැතිය ඒකේ වාසිය ධීවර දෙපාර්තමේන්තුවටයි කියල

**ධීවර පරීක්ෂක:** නෑ නෑ ජාත්‍යන්තරයේ ලංකාව වගකිමෙන් යුතුව ධීවර කර්මාන්තයෙ යෙදෙනව කියලා ඔප්පු කලාම ඔයගොල්ටමයි හොඳ ඉල්ලුමක් වගේම බාධා නැතිව කර්මාන්තය කරගෙන යන්න ලේසී.

අනෙක මම කිව්ව වගේ ආපදාවක් උනොත් එවෙලාවෙම දැනගන්නත්, ස්ථානය දැන ගන්නත් ලේසි, හැම තැනම හොයන්න ඔනේ නෑ. මාළු බිමක් අහු උනාම උවමනානම් එතැන අනිත් අයටත් දැනුම් දෙන්නත් එක සේවු කරල නැවත එතනටම එන්නත් පුලුවන්, මේකට තව කෑල්ලක් හයි කලොත් ඉතා නිවැරදි කාලගුණවාර්තා ගන්න වගේම ඕනෙම ඈත තැනක ඉදන් ගෙදරට කතා කරන්නත් පුලුවන්. මම කැමතියි පුතා හම්බවෙන්න, වෙලාවක එන්න කියන්නකො ඒ පැත්තෙ

**ධීවර කාර්මිකයා:** විස්තර කිව්වම තමයි මේකෙ වටිනාකම තේරුනේ මහත්තයො. දැන් ඕක වැඩ කරවන්න අපිට තියන දැනුවත් කම ඇතිද ?

**ධීවර පරීක්ෂක:** මේකට එතරම් ලොකු දැනුමක් ඕනෙ නැහැ. ස්වයංක්‍රීයවනේ වැඩ කරන්නෙ. හයි කරපු තැනම තියන එක තමා කරන්න තියෙන්නෙ. බොට්ටු රෙපෙයාර් එකකටවත් ගලවනවනම් දෙපාර්තමේන්තුවට කියන්න ඕනේ. උපකරණෙ හයි කරන්න එන අය වැඩි විස්තර කියල දේවි. එදාට අනිවාර්යෙන්ම එන්න.

**ධීවර කාර්මිකයා:** ඔවු ඔවු මම හැමෝටම එන්න කියන්නම්. ගොඩබිම ඉන්න දවසක හයි කරන්න දා ගත්ත නිසා ලේසියි.

**ධීවර පරීක්ෂක:** ඔවු අනිත් අයටත් ඒ අය ගොඩබිම ඉන්න කිට්ටුම දවස මට කියන්න කියල මතක් කරන්න අපි ඒ දවස්වලම උපකරණෙ හයි කරන්නම්.


**ධීවර කාර්මිකයා:** අපි හිතුවට වඩා දේවල් මහත්තයත් දන්නවනේ

**ධීවර පරීක්ෂක:** අපි හැමෝමම උනන්දුවෙන් මේ ගැන පුහුණු උනානේ. මේ වැඩේට සහය දක්වන එක අපි දෙගොල්ලගේම යුතුකමක්. ධීවර කර්මාන්තය වෙනුවෙන් කරන අයෝජනයක්...

**ධීවර කාර්මිකයා:** එක නම් ඇත්ත මහත්තයෝ, කුණාටුවකට වගේ ආවට මොකද දැන් නම් වහින එකක් නෑ වගේ. මමත් මුදලාලි හම්බවෙලා එන්නම්. මහත්තයට බොහෝම ස්තූතියි මේ ගැන කියල දුන්නට.

**ධීවර පරීක්ෂක:** ප්‍රඩිටත් බොහෝම ස්තූතියි උනන්දුවෙන් මේ ගැන අහගත්තට...

# වරායේ පිලිසඳරක් (02)- අළුත් නීති



සම්පත් ගෙදරට ගොඩවුවේ කල්පනාවේ යෙදෙමිනි. මේ බව දුටු ජූඩ් ඒ ගැන විමසිලිමත් විය. කෙලිලොල් ගතිගුණ ඇති තම පුත්‍රයා මෙසේ කල්පනාවට වැටෙන්නේ ඉතා වැදගත් කාරණයක් නිසා විය යුතුය.

**ජූඩ්:** මොකද පුතා කල්පනාව.

**සම්පත්:** ආ තාත්තේ මට අද ධීවර සර් හම්බ උනානේ වරායෙදි.

**ජූඩ්:** මට කියන්නත් අමතක උනා සර් කිව්වත් එක්ක පුතාට ඇවිත් එයාව හම්බවෙන්න කියල

**සම්පත්:** ඒ මොකටද ?

**ජූඩ්:** මට තේරෙන්නැති දේවලුත් පුතාට ලේසියෙන් කියල දෙන්න පුලුවන් කිව්වේ. ඉතින් මොනවද ඔය ගොල්ලො කතා කලේ.

**සම්පත්:** මොනවද ඉතින් අළුත් ධීවර නීති රීති ගැන තමයි

**ජූඩ්:** අපොයි ඔය ධීවර පනත අපි ගැන හොඳට දන්නවා

**සම්පත්:** නෑ නෑ තාත්තෙ පනත දැන් වෙනස් වෙලා

**ජූඩ්:** මොන වෙනස්කම්ද ?

**සම්පත්:** අපිට වැදගත් වෙනස් කම් කීපයක්ම වෙලා තියෙනවා, විශේෂයෙන්ම අන්තර් ජාතික මුහුදේ රස්සාව ගැන නීති අළුතෙන් ඇවිත් තියනවා

**ජුඩ්:** හැබැට අර එන්.පී.ඕ මහත්තයත් කිව්වා තමයි අළුත් නීති ගේන්නේ නැතිව අන්තර් ජාතික සීමාවේ ධීවර කටයුතු පාලනය කරන්න බෑ කියල.

**සම්පත්:** පාලනයම නෙවෙයි වගකීමෙන් යුතුව ධීවර කර්මාන්තයේ යෙදෙනහැටි ගැන තමයි නීති වල තියෙන්නේ.

**ජුඩ්:** ඉතින් අපි දැන් වගකීමෙන් නෙවෙයිද රස්සාව කරන්නේ

**සම්පත්:** මෙහෙමයි වගකීමෙන් ධීවර කටයුතු කරනව කියන්නේ නීති විරෝධී පන්න කරන්නැති එකම නොවෙයි. අපි කරන ධීවර කටයුතු රජයේ අයට හඳුනාගන්න පුලුවන් විදියට කරන එකයි හරියට පොත්වල ලියල වාර්ථා කරන එකයි. පරිසර හිතකාමීව කර්මාන්තයෙ යෙදෙන එකයි.

**ජුඩ්:** රජයට ඒවා හඳුනාගෙන වැඩක් තියනවද ?

**සම්පත්:** ඔවු ඒ විදියට තමයි ආණ්ඩුවට ඒ කටයුතු පාලනය කරන්න පුලුවන් දත්ත ලැබෙන්නේ. ඒ වගේ ක්‍රමවේදයක් නැතිවුන නිසාලුනේ යුරෝපා සංගමයෙන් අපිට තහනමකුත් දැම්මේ.

**ජුඩ්:** හම් මි. ධීවර මහත්තයත් කිව්වා තමයි අළුත් නීති ගෙනාවෙත් ඒක නිසා කියල. වී.එම්.එස්. එකටත් නීතියක් ගෙනාවනේ.

**සම්පත්:** ඔවු ඒකෙ විදියට අන්තර් ජාතික මුහුදට යනවනම් අනිවාර්යෙන්ම වී.එම්.එස්. හයි කරන්න ඕනේලු. ඒවා සල්ලි දීල ගන්න ඕනෙත් අපිමයි

**ජුඩ්:** දැන් දෙපාර්තමේන්තුවෙන් නොමිලේ නේද දෙන්නෙ

**සම්පත්:** ඔවු මුල් අවුරුද්දේ නොමිලේ දෙනවා අපිට ආධාරයක් විදියට හැබැයි නීතියක් නිසා අපි ඒක දැන් කරන්න බැදිලා ඉන්නවා.

**ජුඩ්:** හරි තව මොනවද තියෙන්නේ

**සම්පත්:** දත්ත අවුරුදු දෙකක්වත් දෙපාර්තමේන්තුවෙ තියනවා සේවු කරල. ඒව අපිට ප්‍රයොජනයට ගන්නත් පුලුවන්. අනෙත් වැදගත් කාරණය තමයි ට්‍රාන්ස්පොන්ඩරය මොනම වෙලාවකවත් ගලවන්නවත්, එකට එන සප්ලයි එක අයින් කරන්නවත් බෑ. කොටින්ම එක උඩින් මොනව හරි දාලා වහන්නවත් බෑ. එහෙම උනොත් ඒ බව ගොඩබිම මධ්‍යස්ථානයට පෙන්වනවා.

**ජූඩ්:** ඇයි එහෙම කරන්න කියන්නේ.

**සම්පත්:** අපි මොනවද කරන්නේ කියල බලාගන්න බැරිවෙනවනේ එතකොට එක වැටෙන්නේ නිසි ආකාරයට තොරතුරු නොදෙන යාත්‍රාවක් විදියට එක වී.එම්.එස්. රෙගුලාසි වලට විරුද්දයි.

ඒ වගේම අපේ බෝට්ටුව ගොඩබිමට කිලෝමීටර 50ක් විතර ලං වුනාම ඒ බව ගොඩබිම මධ්‍යස්ථානයට වාර්ථා වෙනවා එතකොට අපි ගොඩබහින කොටම ධීවර මහත්තය එනව බෝට්ටුව බලන්න අපි එකට ඉඩ දෙන්න ඕනේ. ලොග් පොතේ පිටුව දෙන්න ඕනේ. වරායට ගොඩබහින ෆෝර්ම් එකත් පුරවල දෙන්න ඕනේ.

**ජූඩ්:** ඒවත් ඔය නීති වලම තියන ඒවද

**සම්පත්:** ඔවු දත්ත එක් රැස් කිරීම පිලිබඳව වෙනම රෙගුලාසියක් ආවනේ 2014දි. එකෙ තමයි ඕව තියෙන්නෙ

**ජූඩ්:** තව මොනවද අළුතෙන් ආපු නීති

**සම්පත්:** අපිට හුරු පුරුදු නැති රෙගුලාසියක් තමයි ධීවර ආම්පන්න සලකුණු කිරීමේ නීති

**ජූඩ්:** අප්පා ඒ මොකක්ද එක

**සම්පත්:** අපේ දැල් හරි මරුවැල්පන්න හරි වෙන ආම්පන්නයක් හරි අන්තර්ජාතික මුහුදේ පාවිච්චි කරනවානම් ඒවගේ සලකුණු දාන්න ඕනේ. කොඩියකින් හරි බෝඩ් කෑල්ලකින් හරි. කොඩිය සයිස් එක සෙන්ටිමීටර් 25 X 35ක් වෙන්න ඕනේ.

**ජූඩ්:** මොනවද ඕවගෙ සලකුණු කරන්න ඕනේ.

**සම්පත්:** බෝට්ටුවේ අංකය, නම, අයිතිකාරයගෙ නම ලිපිනය, ස්කිපර්ගේ නම ලිපිනය, කෝල් සයින් එක.

**ජූඩ්:** මම අහන්න කියලම හිටියෙ මොකක්ද කෝල් සයින් එක කියන්නෙ.

**සම්පත්:** බෝට්ටුවේ රේඩියෝ එකට දෙන බලපත්‍රය වගේ එකක්. ඒකෙ අපටම වෙන්කරපු රේඩියෝ කේතයක් දෙනව. ඒක දැන් අනිවාර්‍යය කරල තියෙන්නේ.

**ජූඩ්:** මොන නීතියේද ඒක තියෙන්නේ

**සම්පත්:** හයි සී මෙහෙයුම් ගැන ආපු රෙගුලාසියේ. ඒක ආවෙ 2014දී. ඒක අනුව තමයි දැන් අන්තර් ජාතික මුහුදේ රස්සාව කරන්න ලයිසන් දෙන්නේ.

**ජූඩ්:** හම් ම් තව මොනවද තියන රෙගුලාසි

**සම්පත්:** ආ වරාය රාජ්‍ය වගකීම සම්බන්ද රෙගුලාසි කියල එකකුත් තියනවනේ. හැබැයි. ඒක ගොඩක්ම ගැලපෙන්නේ අපේ රටට එන හරි අපේ මුහුද හරහා යන හරි යාත්‍රා වලට.

**ජූඩ්:** ඒක හොඳයි ඒ අයටත් නීති රීති තදින්ම ක්‍රියාත්මක කරන්න එපැයි

**සම්පත්:** ඔවු ඒකත් මම කියපු වගකීමේ කොටසක්.

**ජූඩ්:** හැබැට උඹ දන්න දේවල්

**සම්පත්:** මම නෙවෙයි තාත්තෙ ධීවර මහත්තුරුත් දැන් මේව ගැන ඉගෙන ගෙන තියෙනවා. ඒ විතරක් නෙවෙයි මේ දේවල් තවත් කෙනෙකුට කියල දෙන්නේ කොහොමද කියලත් පහසුවෙන් වටහල දෙන්න පුලුවන් කොහොමද කියලත් ඒ අය දැන් දන්නවා. ඒක නිසානෙ මම ඔය දේවල් ඉක්මනට ඉගෙනගත්තේ.

**ජූඩ්:** හම් ම් ඒ විතරක් නෙවෙයි පුතේ මම හිතන්නේ තව ගොඩාක් වැදගත් දේවල් ඇති දැනගන්න.

**ඔවු ඒව දැනගන්න එක වැදගත් කියලා මටත් හිතුනා. හේතු සාධකත් එක්කම මේ දේවල් දැනගත්තම ඒවට තියන බයත් කුතුහලයත් නැතිවේවි.** තල මෝසම් මුහුද දිහා බලාගෙන සම්පත් පැවසීය.

# වරායේ පිලිසඳරක් (03)- **තහනම් ආම්පන්න**

කුණා වාරයෙන් පසු යන්තම් ගොඩදාගෙන එනවිටම වාරකන් එන නිසා ඒ ගැන ගාමිණීට ඇත්තේ කනස්සලකි.

කදන්කෝස් එක කරන්නත් ධීවර මහත්තුරු ඉඩ නොදෙති. ඒ මදිවට බෝට්ටුවේ අරගෙන යන දැල් කට්ටි ගාණත් අඩු කරලාය. නීතී ගොඩකි. මහත්වරු කියන දේවල් වලින් කන් පිරීගොස් ඇත. එත් සමහර ආම්පන්න තහනම් කර ඇත්තේ ඇයි දැයි ඇත්තේ ප්‍රශ්නයකි. මේ ගැන තමන්ම ගොස් ඩී.එෆ්.ඕ. මහත්තයා හම්බවී කතා කරන්නට ගාමිණීට උවමනාවිය. වාසනාවකට ඩී.එෆ්.ඕ. මහත්තයා වරායටම ඇවිත් ඇත. ධීවර කැබ් එක වරායේ කෙලවරක නවතා ඇත. එහි ධීවර සහකාර අධ්‍යක්ෂ යනුවෙන් සඳහන් බෝඩ් එකෙන් තමන්ට හමුවන්න අවශ්‍ය නිලධාරී මහතා පැමිණ ඇති බව ගාමිණී දැනගත්තේය.

ආයුබෝවන් ඩී.එෆ්.ඕ මහත්තයෝ මට දැනගන්න ඕනේ මේ හැඹිලි දැල ඇත්තටම තහනම්ද නැද්ද කියලා. සුපුරුදු වාග් කෞශල්‍යයෙන්ම ගාමිණී කතා බහ ඇරඹීය.

**සහකාර අධ්‍යක්ෂ:** ආයුබෝවන් ගාමිණී ඔබතුමන්ලා වගේ දැනුම් තේරුම් තියෙන ධිවර මහත්තුරු මේව ගැන උනන්දු වෙලා දැනගන්න එක බොහෝම හොඳයි.

**ධීවර කාර්මික මහතා:** අපට ප්‍රශ්නයකට තියෙන්නෙ වරින් වර දාන තහනම් ගැනනේ. ඇත්තටම දෙපාර්තමේන්තුවෙන් තහනම් ආම්පන්නයක් කියන්නෙ මොකක්ද කියලා තීරණය කරන්නෙ කොහොමදරැ

**සහකාර අධ්‍යක්ෂ:** මෙහෙමයි යම්කිසි ආම්පන්නයක් තහනම් කරන්න හේතු හතරක් බලපානවා

- ආම්පන්නයෙන් අල්ලන මාළු වර්ගයට හරි වෙනත් මාළු වර්ගයකට හෝ වෙනත් සත්තුන්ට හරි බෝවෙන්න බාධාවක් වෙනවනම්
- පරිසරයට හානි වෙනවනම්
- තෝරා ගන්නෙ නැතිව මාළුන් අල්ලනවානම්
- ඒවගේම ආම්පන්නයක් නිසා සමාජයේ ආරවුල් ඇතිවෙනවා නම්

ඒ ආම්පන්න තහනම් කරන්න ධීවර දෙපාර්තමේන්තුවට සිද්ධවෙනවා

**ධීවර කාර්මික මහතා:** තව ටිකක් පැහැදිලි කරන්න පුලුවන්ද

**සහකාර අධ්‍යක්ෂ:** දැන් මෙහෙමයි අපේ රටේ ඉන්න ඔක්කොම දරුවන් ටිකයි, දරුවන් බිහිකරන්න හැකියාව තියෙන අම්මලයි වෙනත් රටකට යැව්වොතින් ගාමිණිලගේ අපේ කාලයෙන් පස්සෙ මෙහෙ කවුරුවත් ඉතිරි වෙන එකක් නෑ. එහෙම නේද


**ධීවර කාර්මික මහතා:** ඒත් සර් ඒ වගේ දෙයක් වෙන්න ඉඩ නෑනේ.

**සහකාර අධ්‍යක්ෂ:** ඔවු ඒ ගොඩබිම, ඒත් මුහුදෙ මාළුන්ගේ පැටවු ටිකයි පැටවු බිහිකරන්න ඉන්න මවු සත්තුයි අයින් කලොත් ඕනෙම මාළු වර්ගයක් වඳවෙනවා. ඒකට ගතවෙන්නේ අපි හිතනවට වඩා පොඩි කාලයක්. අපි මාළු අල්ලන්න ඕනේ එහෙම දෙයක් සිද්ධනොවෙන්න වග බලාගෙන. ඒ වගේ අම්පන්න තහනම් කරන්න සිද්ධ වෙනවනේ.


**සහකාර අධ්‍යක්ෂ:** දැන් මේ මගේ ක්ෂේත්‍ර පොතේ තියන රූපය බලන්න.

මේකෙ හැටියට අපි ඕනෙවට වඩා පොඩි දැල් දැම්මොත් මාළු රංචුවේ දරුවො ටික අල්ලෙනවා. ඒ වගේම ලොකු මාළු ඔක්කොම අල්ලුවොත් මවු සත්තුටික ඔක්කොම නැතිවෙන්වා. ඒක නිසා කොච්චර වාසි දායක උනත් 100 ක් කාර්‍යක්ෂම ආම්පන්න වලින් මාළු ඇල්ලීම අපිට නවත්වන්න වෙනවා.

හරි ක්‍රමය √




වැරදි ක්‍රමය X



**ධීවර කාර්මික මහතා:** ඒ වර්ගයේ ආම්පන්න මොනවද?

**සහකාර අධ්‍යක්ෂ:** ඇයි ඩයිනමයිට් දාල මාළු අල්ලන එක, විෂ වර්ග දාල මාළු අල්ලන එක, මොක්සි දැල්, තංගුස් දැල් මේව ඔක්කොම මම කිව්ව වගේ මාළු රෑනම අල්ලන ඒවා. ඒවා නීතියෙන්ම තහනම් කරල තියෙනවනේ

**ධීවර කාර්මික මහතා:** එතකොට පරිසරයට හානි කරන ආම්පන්න කිව්වේ

**සහකාර අධ්‍යක්ෂ:** ඔවු පතුලේ තල්ලු කරන හරි ඇදගෙන යන හරි දැල්, කොරල් පරවල එලන දැල් මේවට උදාහරණ මේවගෙ ආම්පන්න තහනම් කරල තියෙන්නෙ අපි අල්ලන මාළු වර්ගයට විතරක් නොවෙයි මුළු පරිසරයටත් ඒක නිසා වෙනත් මාළු හරි සත්තු හරි වඳ වෙන්න බලපාන නිසාත්නේ.

ඒ වගේම දැනටමත් වඳවෙමින් යන සත්තු මොනම ආම්පන්නයක් හෝ යොදාගෙන ඇල්ලීම තහනම් කරන්න වෙනවා. තල්මස්සු, ඩොල්පින්, මුහුදු ඌරන් වගේ මුහුදේ ඉන්න කිරිබොන සත්තු, සමහර මාළු වර්ග මේ වගේ තහනම් කරල තියෙනවා.

**ධීවර කාර්මික මහතා:** දැන් මහත්තයා කියපු කාරණා 04 ට අයිති ඔක්කොම ආම්පන්න තහනම් කියල රෙගුලාසි දාලා තියෙනවද

**සහකාර අධ්‍යක්ෂ:** මෙහෙමයි අහිතකර ආම්පන්න පාලනය කරන ක්‍රම දෙකයි.

- ඉතා පැහැදිලි විදියටම මුහුදේ ඕනෑම තැනක ඕනේම කාලෙක තහනම් කරන්න පුලුවන් ආම්පන්න තහනම් කියල ගැසට් කරනවා
- එහෙම කරන්න බැරි ඉතා සංකීර්ණ විදියට- පාවිච්චි කරන විදිය, ස්ථානය, කාලය වගේ හේතු මත හිතකරද නැද්ද කියන එක තීරණය වන ආම්පන්න ලයිසන් ක්‍රමයක් මගින් උචිත විදියට පාලනය කරනවා. ලයිසන් නැතිව ඒ ආම්පන්නය යොදාගන්න එක තහනම් නේ. ඒ විදියට එක පාලනය කරනවා.

**ධීවර කාර්මික මහතා:** ඒක ටිකක් අපැහැදිලියි

**සහකාර අධ්‍යක්ෂ:** දැන් හිතන්න. හැඹිලි දැල් තහනම් කරන්න අපිට බෑ මොකද නියමිත ඇස් වලින් නියමිත ගැඹුරෙන් දානවනම් ඒක ප්‍රශ්නයක් නෑ. හැබැයි ලයිලා සුරුක්කු වගේ විවිධ නම් වලින් හඳුන්වමින් හැඹිලි දැල් වර්ග ගොඩාක් පාවිච්චි කරනවා. ඒවා සමහරක් මම කියපු ලක්ෂණ 04ට නොවැටී තියෙනවා. සමහර ඒවා එහෙම නෑ. ඒක නිසා ලයිසන් දෙන්නේ නෑ.

**ධීවර කාර්මික මහතා:** හරි හරි දැන් පැහැදිලියි හැඹිලි දැලේ ප්‍රශ්නය, සර් මම හිතන්නේ සමාජ ආරවුල් නැති කිරීමටත් සමහර දැල් වලට දෙපාර්තමේන්තුව ලයිසන් දෙන්නේ නෑ නේද ?

**සහකාර අධ්‍යක්ෂ:** හරියට හරි ඒ විතරක් නෙවෙයි සමහර පාරම්පරික ආම්පන්නත් සමාජ ආරවුල් නිසා සීමා කරල තියෙනවා. හැබැයි ඒවා යම් ප්‍රදේශයකට, කාලයකට සීමා වෙනවා.

**ධීවර කාර්මික මහතා:** අන්තර් ජාතික මුහුදෙදි විතරක් සමහර දේවල් තහනම් වෙන්නේ ඇයිරැ

**සහකාර අධ්‍යක්ෂ:** එක හොඳ ප්‍රශ්ණයක්. අන්තර් ජාතික මුහුදේ තියෙන සම්පත් මුළු ලෝකෙටම අයිති වෙනවා. මුලු ලෝකයේම ගත්තම යම් මාළු වර්ගයක් වඳවීමට හේතුවෙනවා නම් ඒ මාළු අල්ලන එක තහනම් කරන්න වෙනවා. අපේ මුහුදේ බහුලව අහු උනත් කස මෝරා ඇතුළු සමහර මෝරු අන්තර් ජාතික මුහුදේ අල්ලන්න තහනම්නේ. ඒ ලෝකේ අනිත් තැන් වල මොරු ඉතාම දරුණු විදියට වඳවෙන නිසා.

මරුවැල් පන්නය ඉතාම හිතකර පන්නයක් වෙන්නේ මේ නිසානෙ දැන් ගාමිණීම හිතන්න මම කියපු කාරණා 04ටම මේක වැටෙන්නේ නෑනේ. එක නිසා අපේ රටේත් අන්තර්ජාතිකවත් එකට තහනමක් නෑ. කටු සයිස් එකෙනුයි, අතු රැහැනෙ දිගිනුත් අපිට ඔනේ මාළු වර්ගයයි සයිස් එකයි විතරයි අහුවෙන්නෙ. පැටවු අහුවෙන්නෙත් නෑ, මුළු රංචුවම අහුවෙන්නෙත් නෑ, පරිසරයට හානියකුත් නෑ, සමාජ ආරවුලුත් නෑ.

**ධීවර කාර්මික මහතා:** ඉතින් කරමල් දැලත් එහෙම නේද?

**සහකාර අධ්‍යක්ෂ:** ඔවු යම් තරමකට හැබැයි අර අපි අල්ලන මාළු වර්ගය හරියටම තිරණය වෙන්නේ නෑනේ. අපිට ඕනේ නැති අයත් අහුවෙනවනේ, විශේෂයෙන්ම කැස්බෑවෝ, මුහුදු කුරුල්ලො වගේ අයත් අහු වෙනවනේ. නමුත් අපි කරපු ඉල්ලීම් වලට කන් දීලා කට්ටි විස්සකට (කි.මි.2.5කට) සීමා කරල තියෙනවා. ඒ වගේ ප්‍රමාණයක් අරන්යන්න ඉඩ දුන්නේ එක කොන්දේසියක් මත.

**ධීවර කාර්මික මහතා:** ඒ මොකක්ද ?

**සහකාර අධ්‍යක්ෂ:** වැරදිලා හරි කැස්බෑවෙක් හරි මුහුදු කුරුල්ලෙක් හරි මුහුදු ක්ෂීරපායීයෙක් හරි අහු උනොත් වහාම නිදහස් කරන්න ඕනේ. ඒවාට ඕනේ උපකරණ බෝට්ටුවේ අනිවාර්යෙන්ම අරන් යන්න ඔනේ. ඒවා මහා සංකීර්ණ ඒවා නොවෙයි කම්මලක හදන්නත් පුලුවන්.

**ධීවර කාර්මික මහතා:** ඔවු ඔවු මට මතකයි දැනුවත් කිරීමේ වැඩමුළුවේ කියලා දුන්නා.

**සහකාර අධ්‍යක්ෂ:** අපේ ඔෆිස් එකේ තියනවා ඒවාගේ ආදර්ශ ඇවිත් බලාගන්නත් පුලුවන්

**ධීවර කාර්මික මහතා:** ආ...තරහා වෙන්න එපා සර් මෙහෙම කිව්වට හැම අවුරුද්දෙම ලයිසන් ගන්නයි, ඒවා අළුත් කරන එකයි හරි කරදරයක්නේ. අනික මේ ධීවර අපිට තමයි නීති ඔක්කොම.

**සහකාර අධ්‍යක්ෂ:** එහෙම නෑ පාරේ වාහනයක් එලවන කොට නීතී කීයක් තියනවද, ගොවි මහත්තයෙකුට නීතී කොච්චර තියනවද. ඒ ඔක්කොමත් රට ඇතුලේ වෙලා අන්තර් ජාතික මුහුදට යනවනම් නීති ඕනේම වෙනවනේ. අහසේ අන්තර්ජාතික සීමාවට යනවනම් පයිලට්ලාට නිතී ගොඩාක් තියෙනවා. ඒ අතින් ඔයගොල්ලෝ වාසනාවන්තයි.

ඒ වගේම තමයි නීති රීති තිබුනත් ඒවා නොකඩා වැඩ කරන්න පුලුවන් අයට විතරයි ලයිසන් දෙන්නේ. ඒ වැඩේ හරියට රථවාහන නීතී රීතී දාල ඒවා පිලිපදින්න හැකියාව තියන අයටයි වාහන වලටයි විතරක් ලයිසන් දෙනවා වගේ වැඩක්නේ. ධීවර කර්මාන්තෙට අළුතෙන් ආපු නීති ගොඩාක් ඒවා පරිසර හිතකාමී ධීවර කර්මාන්තයක් වෙනුවෙන් හදපුවා. හරියට වාහන වලට ලගදි ආපු දුම් පරීක්ෂාව වගේ දෙයක්.

**ධීවර කාර්මික මහතා:** සර් හම්බවෙච්ච එක ලොකු දෙයක් දැන් මේ හැම නීතියකම හේතුව මම දන්නවා. මම ගිහිල්ලා එන්නම් බොහෝම ස්තුතියි මේවා කියලා දුන්නට

**ධීවර කාර්මික මහතා:** ගාමිණීටත් ස්තුතියි උනන්දුවෙන් මේවා අහගෙන ඉගෙන ගත්තට.

**සහකාර අධ්‍යක්ෂ:** ආ තව එකක් මෙන්න මේ අත් පත්‍රිකාවේ තියෙනවා දැනට ගැසට් මගින් තහනම් නොවේ කියලා ප්‍රකාශ කරපු ආම්පන්න වල ලැස්තුවක් ඒකත් අරන් යන්න දන්න හැමෝටම මේ ගැන කියලා දෙන්න ගාමිණිල වගේ උගත් අයට තමයි මේවා අනිත් අයටත් කියලා දෙන්න පුලුවන්.

- මාදැල
- ඇදගෙනු යනු ලබන දැල
- ත්‍රිත්ව දැල
- කරමල් දැල
- පාවෙන කරමල් දැල
- වටකරන කරමල් දැල
- මරුවැල් පන්නය
- වීසි දැල
- මත්ස්‍ය උගුල්
- කට්ටු දැල
- ද්වි-කපාටික බෙල්ලන් ඇල්ලීම
- මුහුදු කූඩැල්ලන් ඇල්ලීම
- හක්-බෙල්ලන් ඇල්ලීම
- පිල අතු
- මත්ස්‍ය එකාරාශික ඇටවුම්
- අතෝලි-ඔසවන දැල්
- කිමිදුම් මගින් කරන ධීවර මෙහෙයුම්

**වර්තමාන ධීවර කර්මාන්තය තමන් හිතනවාට වඩා සංකීර්ණ බවත් වර්තමාන නීති-රීති අනාගත පරපුර ගැන සිතා ඉතාම තර්කානුකූලව ඉදිරිපත් වූ ඒවා බවත් ජැටිය දිගේ ඉදිරියට ඇදෙන ගාමිණීගේ කල්පනාවට වැටිනි.**

සැකැස්ම :

එන්.ඩී.පී. ගුණවර්ධන

# ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ
# ජාත්‍යන්තර ධීවර කටයුතු පිලිබඳ ඒකකයේ පණිවිඩයකි

වැඩි විස්තර සඳහා:

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමා | 011 2 449 170 |
| අධ්‍යක්ෂ(කළමණාකරන) | 011 2 446 291 |
| අධ්‍යක්ෂ (කර්මාන්ත) | 011 2 472 199 |
| ප්‍රධාන කාර්යාලය | 011 2 446 183 |

දිස්ත්‍රික් කාර්යාල

| | |
|---|---|
| කොළඹ | 011 2 716 868 |
| කළුතර | 034 2 222 482 |
| ගාල්ල | 091 2 234 908 |
| මාතර | 041 2 222 010 |
| තංගල්ල | 047 2 240 208 |
| අම්පාර | 067 2 229 363 |
| මඩකලපුව | 065 2 224 472 |
| ත්‍රිකුණාමලය | 065 2 224 472 |
| මුලතිවු | 024 3 248 599 |
| කිලිනොච්චි | 021 2 285 964 |
| යාපනය | 021 2 222 532 |
| මන්නාරම | 023 2 222 173 |
| පුත්තලම | 032 2 265 295 |
| හලාවත | 032 2 254 279 |
| මීගමුව | 031 2 222 431 |